රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 17/2008

මගේ අංකය : EST 5/4/1/13(VII)
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2008.08.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ සහ
<u>අධි පන්තියේ වැටුප් විෂමතා ඉවත් කිරීම</u>

2004.01.01 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය ස්ථාපනය කිරීමෙන් පසු එහි I පන්තියට හා අධි පන්තියට උසස්වීම් ලබන නිලධාරීන්ට ලැබෙන වැටුපට වඩා සාපේක්ෂ වශයෙන් අඩු වැටුපක්, එදිනට පෙර අදාළ සේවාවන්හි (සාමාන්‍ය ලිපිකාර සේවය, යතුරු ලේඛක සේවය, ලඝු ලේඛක සේවය, පොත් තබන්නා සේවය, සරප් සේවය හා ගබඩා භාරකාර සේවය) I පන්තියට සහ අධි පන්තියට උසස් වූ සමහර නිලධාරීන්ට ලැබීමෙන් ඇතිවී තිබෙන විෂමතාවය ඉවත් කිරීම සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය මත පහත සඳහන් පරිදි කටයුතු කිරීමට තීරණය කර ඇත.

02. (I) වැටුප් විෂමතා ඉවත් කිරීමේ කාර්යය සඳහා පමණක්, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වූ සේවාවල II "අ" පන්තියේ සිට I පන්තියට, 2003.12.31 හෝ ඊට පෙර උසස්වීම් ලද හා ඒ හේතුවෙන් වැටුප් විෂමතා ඇතිවී තිබෙන නිලධාරීන්, 2004.01.01 දින දක්වාම අදාළ සේවාවේ II "අ" පන්තියේ සිටියා සේ කල්පිතව සලකා, 2004.01.01 දිනට පසුව යෙදෙන, දැනටමත් ලබා ඇති උසස්වීමට අදාළ ආසන්නතම වැටුප් වර්ධක දිනයේදී උසස්වීම ලැබුවායයි කල්පිතව සලකා වැටුප් පරිවර්තනය කිරීම.

(II) එමෙන්ම අදාළ සේවාවල I පන්තියේ සිට අධි ශ්‍රේණියට 2003.12.31 හෝ ඊට පෙර උසස්වීම් ලද හා ඒ හේතුවෙන් වැටුප් විෂමතා ඇතිවී තිබෙන නිලධාරීන් 2004.01.01 දින දක්වාම I පන්තියේ සිටියා සේ කල්පිතව සලකා 2004.01.01 දිනට පසුව යෙදෙන, දැනටමත් ලබා ඇති උසස්වීමට අදාළ ආසන්නතම වැටුප් වර්ධක දිනයේදී උසස්වීම ලැබුවා යයි කල්පිතව සලකා වැටුප් පරිවර්තනය කිරීම.

උදා :- සාමාන්‍ය ලිපිකරු සේවයේ II "අ" පන්තියේ සිට සා.ලි.සේ. I පන්තියට 2001.06.01 දින උසස්වීම ලද නිලධාරියකු 2004.06.01 දින උසස්වීම ලැබුවායයි කල්පිතව සැලකිය යුතු අතර ඒ අනුව වැටුප් පරිවර්තනය කල යුතුය. (මේ අනුව ජූලි 22 දිනට වැටුප් වර්ධකය යෙදී තිබූ 2001.06.01 දින සා.ලි.සේ. II "අ" නිලධාරියකුගේ වැටුප් පරිවර්තනය කළ යුතු ආකාරය දැක්වෙන ආදර්ශයක් ඇමුණුම I හි වේ.)

03. දැනට උසස්වීම් ලැබී ඇති දින සිට ඉහත **02** වන ඡේදයේ සඳහන් පරිදි, උසස්වීම ලැබුවා සේ කල්පිත වශයෙන් සැලකෙන දිනය දක්වා වූ වැටුප් වර්ධක උපයා ගැනීම සඳහා නියමිත සියලු අවශ්‍යතා සපුරා තිබුණේ නම්, එවකට ක්‍රියාත්මකව පැවති විධිවිධාන යටතේ, වැටුප් වර්ධක කල්පිත පදනමින් ලබාදිය යුතුය. මෙම කාර්යය සඳහා අදාළ කරගත යුත්තේ උසස්වීමට පෙර දුරූ ශ්‍රේණියේ වැටුප් වර්ධක වටිනාකම වේ. එසේ ගණනය කර කල්පිත වශයෙන් උසස්වීම ලැබුවායයි සැලකෙන දින සිට ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ **5** වැනි වගන්තිය යටතේ කල්පිත පදනම මත වැටුප් පරිවර්තනය කල යුතු අතර, ඉන්පසු උපයාගෙන ඇති වැටුප් වර්ධකඳ කල්පිත පදනමින් එකතු කල යුතුය. එම කාලය තුල වෙනත් පත්වීමක්/උසස්වීමක් ලැබී ඇත්නම්, එම පත්වීම/උසස්වීම යටතේ වැටුප් පරිවර්තනය කිරීම සඳහාඳ කල්පිතව ගණනය කරන ලද වැටුප් පියවර යොදගත යුතුය.

04. **<u>මෙම චක්‍රලේඛය යටතේ වැටුප් පරිවර්තනය කිරීම, අදාල සේවාවල සිට 2004.01.01 දින රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට පමණක් සීමාවිය යුතුය.</u>** එමෙන්ම **2004.01.01** දින රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වී සේවයේ නිරතව සිට ඊට පසු විශ්‍රාම ලබා ඇති නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ද මේ අනුව සංශෝධනය විය යුතුය. මෙකී වැටුප් සංශෝධන හේතුවෙන් **2008.08.31** දින දක්වා හිඟ මුදල් නොගෙවන අතර **2008.09.01** දින සිට සංශෝධිත වැටුප් සහ සංශෝධිත විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය.

05. ඉහත විධිවිධාන අනුව, වැටුප් සංශෝධනය කල යුතු යයි සඳහන් කල්පිත දිනය දක්වා පමණක්, අදාල නිලධාරීන් පහළ තනතුරේ සිටියා සේ, සැලකුවද එමගින් නිලධාරියකුගේ ජ්‍යෙෂ්ඨත්වයට කිසිදු හානියක් නොවන අතර වැටුප් සංශෝධනය හැර අනෙකුත් සියලු කාර්යයන් සඳහා අදාල විය යුත්තේ නිලධාරියාගේ උසස්වීම නිත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක වූ දිනයයි.

06. මෙම චක්‍රලේඛය ජාතික වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ හා මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත නිකුත් කරනු ලැබේ.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම - I

ජූලි 22 දිනට වැටුප් වර්ධකය යෙදී ඇති සා.ලි.සේ. II "අ" පන්තියේ නිලධාරියකු උසස් නොවුයේ නම් වැටුප් පරිවර්තනය		2001.06.01 දින I පන්තියට උසස්වීම මත වැටුප් පරිවර්තනය		2004.06.01 දින කල්පිත පදනම මත උසස්වූයේ නම් වැටුප් පරිවර්තනය	
2000.07.22	රු. 69480/-	2001.06.01	රු. 71040/-	2004.05.31	රු. 99840/-
2001.07.22	රු. 71040/-	2002.06.01	රු. 72600/-	2004.06.01	රු. 104040/-
2002.07.22	රු. 72600/-	2003.06.01	රු. 74160/-	2004.12.01	රු. 134040/-
2003.07.22	රු. 74160/-	2004.01.01	රු. 91980/-	2005.06.01	රු. 137520/-
2004.01.01	රු. 99840/-	2004.06.01	රු. 93540/-	2006.01.01	රු. 16448/-
2004.07.22	රු. 101400/-	2004.12.01	රු. 123540/-	2006.06.01	රු. 16738/-
2004.12.01	රු. 131400/-	2005.06.01	රු. 125100/-	2007.01.01	රු. 19380/-
2005.07.22	රු. 133620/-	2006.01.01	රු. 15153.75		
2006.01.01	රු. 15509.25	2006.06.01	රු. 15443.75		
2006.07.22	රු. 15719.25	2007.01.01	රු. 17930/-		
2007.01.01	රු. 17780/-				